# XII වන පරිච්ඡේදය

## ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන තැනැත්තන් හට ලබාදෙන විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි

1. සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු සඳහා හිමිකම්
2. සාමාන්‍ය නිවාඩු ප්‍රමාණය අවසන් වූ පසුව
3. අඩ වැටුප් නිවාඩු
4. තව දුරටත් වැටුප් රහිත නිවාඩු
5. සැහැල්ලු රාජකාරි
6. බෝවන රෝග

## XII වන පරිච්ඡේදය

## ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙළෙන තැනැත්තන් හට ලබාදෙන විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි

1. **සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු සඳහා හිමිකම්**

වැටුප් සහිත විශේෂ නිවාඩු ලබා ගැනීමට සුදුස්සකු වීම

කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ නියුතු ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයන්ට, මාසික වැටුප් මත දෛනික වැටුප් මත මෙන්ම, එකී දෙවර්ගයේ ම වැටුප් මත සේවය කරන එක් අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති තාවකාලික සේවකයින්ට ද, ක්ෂය රෝගය, ලාදුරු රෝගය, පිළිකාවක් හෝ නිදන් ගත වකුගඩු රෝගය යන රෝගවලින් පෙළෙන විට, ඔවුන් එකී රෝගවලින් සුවය ලැබීමට ඉඩ ඇති බවට කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයේ / විද්‍යායතනයේ ඉල්ලීම මත, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරන ලද වෛද්‍ය මණ්ඩලයකින් නිර්දේශ කළ අවස්ථාවක දී, එම තැනැත්තන් හට පහත සඳහන් පරිදි වැටුප් සහිත නිවාඩු ලබාදිය හැකි ය.

1.1 ක්ෂය රෝගය : එක් වරකට මාස (09) බැගින් කඩින් කඩ දෙවතාවක දී සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු. එනම්, ප්‍රථම වතාවේ දී මාස නවයක් ද (09), ඉන් අනතුරුව එම තැනැත්තා යළිත් සේවයට පැමිණ අවුරුදු හතරකට (04) නො අඩු කාලයක් සේවයේ යෙදුන පසුව තවත් මාස නවයක (09) නිවාඩු ද ලබාදිය හැකි ය.

ක්ෂය රෝගය : මාස නවයක (09) වැටුප් සහිත විශේෂ නිවාඩු

1.2 ලාදුරු රෝගය : ලාදුරු රෝගය වැළඳුන අයෙක් සඳහා මාස විසි දෙකක (22) කාලයක් ඉක්ම නොයන පරිදි වැටුප් සහිත විශේෂ නිවාඩු ලබාදිය හැකි ය.

ලාදුරු රෝගය : මාස විසිදෙකක් (22) ඉක්ම නොයන පරිදි

1.3 පිළිකාවක් : මාස හයක (06) කාලයක් ඉක්ම නොයන පරිදි වැටුප් සහිත විශේෂ නිවාඩු කාලයක්

පිළිකා තත්වයට : මාස හයක් (06) ඉක්ම නොයන පරිදි

1.4 නිදන් ගත වකුගඩු රෝගය : මාස හයක (06) කාලයක් ඉක්ම නොයන පරිදි වැටුප් සහිත විශේෂ නිවාඩු කාලයක්

නිදන් ගත වකුගඩු රෝගය : මාස හයක් (06) ඉක්ම නොයන පරිදි

1.5 කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් කරන ලද ඉල්ලීමකට අනුව පත් කරන ලද වෛද්‍ය මණ්ඩලයක් මඟින් සහතික කරන ලද ඉහත 1.1, 1.2, 1.3 සහ 1.4 යන උපඡේද යටතේ දක්වා ඇති රෝගයකට සමාන රෝගයකින් පෙළන තැනැත්තෙකු සහ බරපතල ශල්‍ය කර්මයකට භාජනය වීමෙන් පසු වෛද්‍ය මණ්ඩලයකින් කරන ලද නිර්දේශයකට අනුව, ආදී වශයෙන් එම තැනැත්තන් හට මාස හයක (06) කාලයක් ඉක්ම නොයන පරිදි සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු ලබා දිය හැකි ය. ( X වන පරිච්ඡේදයේ 8.2 උපඡේදය බලන්න)

වෙනත් රෝගයක් හෝ ශල්‍ය කර්මයකට පසුව

1.5.1 මෙහි සඳහන් විධි විධානයන්ට අනුව නිවාඩු ලබාදෙන විට, මෙම පරිච්ඡේදයේ දක්වා ඇති සියළුම කොන්දේසි පිළිපැදිය යුතු ය.

1.5.2 ඉහත 1 වන ඡේදයට සහ 1.5 උපඡේදයන්ට අනුව කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය මඟින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කරනු ලබන වෛද්‍ය මණ්ඩලය හැකි සෑම අවස්ථාවකදී ම පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු වේ.

වෛද්‍ය මණ්ඩලය

(අ) අදාල තැනැත්තා ප්‍රතිකාර ලබමින් සිටින ශික්ෂණ / මහා / මූලික රෝහලේ අධ්‍යක්ෂවරයා

(ආ) ප්‍රතිකාර ලබන රෝගයට අදාල විශේෂඥ වෛද්‍යවරයා ද ඇතුළු තවත් විශේෂඥ වෛද්‍යවරුන් දෙදෙනෙකු

2. ඉහත සඳහන් විධිවිධාන යටතේ ලබාදෙන සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ලබාදිය යුත්තේ, එම තැනැත්තා හට සාමාන්‍ය නිවාඩු රෙගුලාසි යටතේ සාමාන්‍යයෙන් හිමි සියළුම නිවාඩු අවසන් වීමෙන් පසුව, මෙහි 2.1 සිට 2.4 උපඡේදයේ දක්වා වූ නියමයන්ට යටත්ව ය.

සාමාන්‍ය නිවාඩු අවසන් වූ පසුව පමණකි

2.1 අදාල තැනැත්තා ක්ෂය රෝගය, ලාදුරු රෝගය, පිළිකාවක්, නිදන්ගත වූ වකුගඩු රෝගය ආදී රෝගයකින් පෙළෙන බවට දැක්වෙන පළමු වෛද්‍ය සහතිකය ලැබුන විට, අදාල පරිදි කොමිෂන් සභාව / උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනය විසින්, එම තැනැත්තා, තමා පෙළෙන රෝගයෙන් සුවය ලැබීමට සෑහෙන අවස්ථාවක් තිබේ ද යන්න නිශ්චය කර ගැනීම පිණිස වෛද්‍ය මණ්ඩලයක් වෙත ඉදිරිපත් කළ යුතු වේ.

පළමු වෛද්‍ය මණ්ඩලය

2.2 අදාල තැනැත්තා වෛද්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කරන ලද ප්‍රතිකාර පන්තිය නිසි පරිදි ලබා ගත යුතු ය.

ප්‍රතිකාර ගැනීම අනුමත කළ ආයතනයන්ගෙන් විය යුතු ය

2.2.1 ක්ෂය රෝගයෙන් පෙළෙන අයකු නම්, හැකි සෑම අවස්ථාවකදී ම ඔහු ප්‍රතිකාර ලබා ගත යුත්තේ සුඛාගාරය (Sanatorium) ප්‍රාදේශීය රෝහලක ක්ෂය රෝග වාට්ටුවක හෝ නිවසේ දී (නිවසේ දී ප්‍රතිකාර) යන ස්ථානයක දී ය. එම ප්‍රතිකාර ලබා ගත යුත්තේ ක්ෂය රෝගය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ ය. එවැනි විශේෂඥ වෛද්‍යවරයකු නොමැති නම් වෙනත් සුදුසුකම් ඇති වෛද්‍යවරයකු යටතේ ප්‍රතිකාර ලබාගත හැකි ය.

2.3 සෑම සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු කාලයක් ම, නිසි වෛද්‍ය සහතිකයක් මඟින් හෝ වෛද්‍ය මණ්ඩල වාර්තාවන් මඟින් ආවරණය විය යුතු ය.

වෛද්‍ය සහතික

2.4 මෙම විධිවිධාන යටතේ ලබා දෙනු ලැබූ නිවාඩු අවසන් වූ වහාම, අදාල තැනැත්තා හට තමා පෙළුනු රෝගයෙන් සුවය

වෛද්‍ය මණ්ඩලයක නිර්දේශය ලබා ගත

ලැබීමට අවස්ථාවක් ඇති / නැති බවට සහ එසේ සුවය ලැබීමෙන් පසු වැඩිදුරටත් සේවයේ යෙදීමට හැකියාවක් ඇත් ද යන්න සම්බන්ධයෙන් වෛද්‍ය මණ්ඩලයක් මඟින් වාර්තාවක් ලබාගත යුතු වේ. — යුතු ය

3. මෙම විධිවිධාන යටතේ ලබා දෙන සියළුම නිවාඩු අවසන් වූ විට, එම තැනැත්තා හට, X වන පරිච්ඡේදයේ 20 වන ඡේදයෙහි සඳහන් ආකාරයට අඩ වැටුප් නිවාඩු ලබා ගැනීමට අවසර දිය හැකි ය. එසේ අඩ වැටුප් නිවාඩු ලබා ගැනීමට අවසර ලැබෙන්නේ මෙම පරිච්ඡේදයේ 2.4 උපඡේදයට අනුව දක්වා ඇති පරිදි වෛද්‍ය මණ්ඩලයක් මඟින් වැඩිදුරටත් නිවාඩු ලබාදිය යුතු යැයි නිර්දේශ කළ විටක දී පමණකි. — අඩ වැටුප් නිවාඩු

4. වෛද්‍ය මණ්ඩලයක් මඟින් තව දුරටත් නිවාඩු ලබාදීම නිර්දේශ කරන්නේ නම්, සහ එසේ නිවාඩු ලබාදීම හේතුවෙන්, අදාල තැනැත්තා හට සුවය ලැබීමට සැහෙන අවස්ථාවක් ඇතැයි යන්න ගැන ප්‍රකාශයක් කරන්නේ නම් ද, කොමිෂන් සභාවේ සභාපතිවරයා / විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා /මණ්ඩපයක මණ්ඩපාධිපතිවරයා / විශ්වවිද්‍යාලයීය විද්‍යායතනයක / ආයතනයක අධ්‍යක්ෂවරයා / උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක අධ්‍යක්ෂවරයා විසින් තම අභිමතය පරිදි X වන පරිච්ඡේදයේ 21 වන ඡේදයෙහි නියමයන්ට අනුව වැඩිදුරටක් වැටුප් රහිත නිවාඩු ලබාදිය හැකි ය. — වැඩි දුරටත් වැටුප් රහිත නිවාඩු

5. යම් තැනැත්තකු හට / යම් කොන්දේසි යටතේ එනම් සැහැල්ලු රාජකාරී ලබාදීම මත නැවත සේවය ආරම්භ කිරීම සුදුසු යැයි වෛද්‍ය මණ්ඩලය විසින් නිර්දේශ කර ඇති විටක දී, ඔහුට සැහැල්ලු රාජකාරී ලබාදිය යුතු අතර, ඔහුගේ රාජකාරි ජීවිතය පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය සෑම උපකාරයක්ම ලබාදිය යුතු ය. — සැහැල්ලු රාජකාරී

6. **බෝවන රෝග**

6.1 කොමිෂන් සභාවේ / උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක සේවයේ යෙදී සිටින තැනැත්තෙකු හෝ ඔහු පදිංචි නිවසේ සිටින තැනැත්තකු හෝ පහතින් දක්වා ඇති නිරෝධායනය කළ යුතු හෝ නිරෝධායනය නො කළ යුතු බෝවන රෝගයකින් පෙලෙන බවට දැනගත් වහාම, ඒ බව තමා සේවය කරන කොමිෂන් සභාවට / උසස් අධ්‍යාපන ආයතනයට / විද්‍යායතනයට වහාම දැනුම් දිය යුතු වේ. — විශ්වවිද්‍යාල දැනුවත් කළ යුතු ය

නිරෝධායනය කළ යුතු රෝග : — රෝගය

- කොළරාව
- මහාමාරිය
- පුනරාවර්තන උණ ( උකුණන්ගෙන් බෝවන)
- වසූරිය
- ටයිපස් උණ (උකුණන්ගෙන් බෝවන)
- කහ උණ
- සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිරෝධායනය කළ යුතු රෝගයක් ලෙසට නම් කළ වෙනත් රෝගයක්

නිරෝධායනය නො කළ යුතු රෝග :

- පැපොල

අතීසාරය
ආන්ත්‍රික උණ
සාමාන්‍ය කල් පවතින උණ
උග්‍ර පූර්ව බාලක පක්ෂාගාතය
මශ්තිෂ්ක කශේරුකා උණ
ඩිප්තීරියාව
බෝවන සෙංගමාලය
ටයිපස් උණ ( උකුණන්ගෙන් බෝ නොවන)

6.2 ඉහත 6.1 ඡේදයෙහි සඳහන් රෝගයන් වාර්තා වූ වහාම, ඒ බව දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා වෙත හෝ අදාල පළාත් පාලන ආයතනයේ වෛද්‍ය නිලධාරියාට හෝ දැනුම් දිය යුතු වේ. දිස්ත්‍රික වෛද්‍ය නිලධාරියා දැනුවත් කළ යුතු ය

6.3 නිරෝධායනය කළ යුතු බෝවන රෝගයකින් පෙළෙන අයෙකු ස්පර්ශ වූ අයෙකු අන් අයගෙන් වෙන්කර තැබිය යුතු වූ විට, එම තැනැත්තා හට එසේ වෙන් කොට තැබිය යුතු කාලය සඳහා වැටුප් සහිත විශේෂ නිවාඩු ලබා දිය යුතු වේ. (X වන පරිච්ඡේදයේ 8 වන ඡේදය බලන්න) නිරෝධායනය කළයුතු / නොකළ යුතු රෝගයකින් පෙළෙන අයකු ස්පර්ශ වූ තැනැත්තන්

6.4 නිරෝධායනය නොකළ යුතු රෝගයකින් පෙළෙන අයෙකු ස්පර්ශ වූ තැනැත්තෙකු සේවා ස්ථානයෙන් බැහැර කොට තැබිය යුතු නොවේ.

6.5 තම සේවා කාලය තුල දී හමුවන නිරෝධායනය කළ යුතු හෝ නිරෝධායන නො කළ යුතු අයෙකු සම්බන්ධ තොරතුරු අදාල උසස් අධ්‍යාපන ආයතනයේ වෛද්‍ය නිලධරයා විසින් නියමිත සෞඛ්‍ය බලධාරීන් වෙත වාර්තා කළ යුතු වේ. එමෙන්ම, මෙම සිදුවීම සම්බන්ධයෙන් රෝගයෙන් පෙළෙන තැනැත්තාගේ / තැනැත්තන්ගේ නම් සහ යම් සේවකයකු පවුලේ සාමාජිකයකු එවැනි රෝගයකින් පෙළෙන්නේ නම් එම සේවකයාගේ නම ද ඇතුලත් තොරතුරු කොමිෂන් සභාවටද, අදාල උසස් අධ්‍යාපන ආයතනය / විද්‍යායතනයටද, දැනුම් දිය යුතු ය.